වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

10 කාණ්ඩය 02 කලාපය

2024 පෙබරවාරි

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු.70.00

ගොවීන් මහ පාරට යුරෝපා පාර්ලිමේන්තුව වටලයි

බෙල්ජියමේ බ්‍රසල්ස්හි පිහිටි යුරෝපා පාර්ලිමේන්තුව දහස් ගණන් ගොවීන් විසින් වටලා විරෝධය පළකරමින් පාලකයන් මත පීඩනයක් එල්ල කරනු ලැබුවා.

යුරෝපා සංගමයේ හරිතාගාර වායු විමෝචනයෙන් 11% ක් එහි කෘෂිකාර්මික අංශයෙන් සිදුවීම ගණන් බලන යුරෝපා පාර්ලිමේන්තුව 2050 වන විට දේශගුණ තත්ත්වය සාමාන්‍යකරණය කර ගැනීම සඳහා වගා කරන ඉඩම් වලින් 4%ක් අත්හැර දැමීම, පොහොර භාවිතය 20%කින් අඩු කිරීමත් ධාන්‍ය ආනයනය සඳහා නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළැඹීමත් යෝජනා කර තිබෙනවා. සත්ව පාලනය නිසා වායුගෝලයට මුදාහැරෙන නයිට්‍රජන් ප්‍රමාණය අවම කිරීමට සත්ව ගොවිපල වසා දැමීමත් යෝජනා වී තිබෙනවා .

ජර්මන් ආණ්ඩුව අයවැය තුලනය කිරීම සඳහා ගොවීන් වෙත ලබා දී තිබූ කෘෂිකාර්මික ඩීසල් සහනාධාරය කපා හැරීම ගොවීන්ගේ කෝපය වඩාත් වැඩි කර තිබෙනවා .

මෙම ගොවි විරෝධතා ජර්මනිය, ප්‍රංශය, නෙදර්ලන්තය, පින්ලන්තය, ස්පාඤ්ඤය හරහා මුළු යුරෝපය පුරා පැතිරීමත් සමග සහන පැකේජ ක්‍රියාත්මක කිරීමට යුරෝපා ආණ්ඩුවලට සිදු වී තිබෙනවා.

පුද්ගල තොරතුරු පද්ධතිය ඉන්දියානු ධනපතියන්ගේ ග්‍රහණයට!

ලංකාවේ විද්‍යුත් හැඳුනුම්පත් ව්‍යාපෘතිය (eNIC) ඉන්දියානු සමාගමක් වෙත භාරදීම හේතුවෙන් ලාංකික පුරවැසියන්ගේ අතිශය පෞද්ගලික ජෛවමිතික තොරතුරු ඉන්දියානු ධනපතියන්ගේ ලාභ අරමුණු වෙනුවෙන් භාවිත වීමේ අනතුරක් උද්ගත වී ඇත. වත්මන් නවලිබරල් වෙළඳපොළ යාන්ත්‍රණය තුළ පුද්ගල තොරතුරු මගින් විශ්ලේෂණය කරගනු ලබන පුද්ගල අවශ්‍යතා, රුචිකත්වයන්, කායික දුබලතා, රෝගී තත්වයන් ආදිය පවා වෙළඳපොළ ලාභ අරමුණු වෙනුවෙන් යොදා ගනු ලැබේ.

මීට පෙර, මහින්ද රාජපක්ෂ පාලනය මෙන්ම 'යහපාලන' ආණ්ඩුව විසින් ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් (eNIC) වැඩපිළිවෙළක් ආරම්භ කළ නමුත් ජනතාවගේ බලවත් විරෝධය නිසා හකුළා ගනු ලැබිණි. රනිල් රාජපක්ෂ ආණ්ඩුව විසින් පිළිගත් පටිපාටින් හා ජාතික රාජ්‍යයේ ජනතාවගේ ආරක්ෂාව ද නොසලකා යමින්, ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය නැවත වරක් වෙනත් ඉන්දියානු සමාගමක් වෙත භාර දී තිබේ. මෙහිදී මිලියන 22කට ආසන්න මෙරට පුරවැසියන්ගේ අතිශය සංවේදී ජෛව දත්ත, ඇඟිලි සලකුණු, මුහුණේ අනන්‍ය ලක්ෂණ වැනි ජෛවමිතික දත්ත, ඊ හැඳුනුම්පත තුළ අන්තර්ගත කිරීම සඳහා මෙම ඉන්දීය සමාගම වෙත සැපයීමට නියමිතය. මේ තොරතුරු ක්‍රමලේඛනගත කිරීම පුරවැසියකුගේ පෞද්ගලික රහස්‍යතාවය සහ ආරක්ෂාව සම්බන්ධ පිළිගත් නීති 02 පිටුවට

No Farmers, No Food, No Future!

බ්‍රසල්ස්හි යුරෝපා පාර්ලිමේන්තුවේ ගොවි විරෝධී නව නීතිවලට විරෝධය පළ කරමින් 'ගොවීන් නැතිනම්, ආහාර නැත, අනාගතයක්ද නැත' යන ඉන්දිය ගොවි අරගලයේ සටන් පාඨය රැගෙන ප්‍රංශය, නෙදර්ලන්තය, ජර්මනිය ආදී රටවලින් පැමිණි ගොවීන් නගර වීදි මහාමාර්ග අවහිර කරමින් විරෝධය පළකළ අවස්ථාවක් මෙම ඡායාරූපයේ දැක්වේ.

IMF කුමන්ත්‍රණය ඉදිරියට රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණයට නව පනතක්

හඳුනාගත් රාජ්‍ය ව්‍යවසායන් 135ක් වහාම පෞද්ගලීකරණය සඳහා 'රජය සතු ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය' (SOERU) වේගයෙන් මැදිහත් වෙමින් සිටී.

එම ඒකකය විසින් හඳුනාගත් රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය සඳහා සකස් කරනු ලැබූ නව පනත් කෙටුම්පතක් දැනටමත් ජනාධිපතිවරයා හා මුදල් අමාත්‍යාංශය වෙත භාරදී තිබේ. අවශ්‍ය නීතිමය ආවරණයක් සහිත ව්‍යවස්ථාදායක අධිකාරියක් හා මෙහෙයුම් බලපෑමේ හැකියාවක් නිර්මාණය කරගැනීම මෙහි අරමුණ බව පැවසේ.

හඳුනාගත් ආයතන 135න් 85ක් වාණිජ ආයතන ලෙස නම් කර ඇති අතර සිංගප්පූරුවේ තමසෙක්(TEMASEK) ව්‍යුහයට අනුව ගොඩනගනු ලබන රාජ්‍ය ව්‍යවසාය 02 පිටුවට

LNG සැපයුමත් ඉන්දියාව ඩැහැගනී!

වැඩිවන බලශක්ති ඉල්ලුම හමුවේ වසර 2030 වන විට ලංකාවේ විදුලි බලාගාරවල බලශක්ති ප්‍රභවය ලෙස ස්වභාවික ද්‍රව ඉන්ධන (LNG) යොදා ගැනීමේ සැලැස්ම විදුලි බල මණ්ඩලය විසින් සකස් කර ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගත්තේ වසර ගණනාවකට පෙරයි.

බලාගාර ඊට අදාළව තාක්ෂණික ක්‍රමවේද එක් කරමින් යාවත්කාලීන කිරීමද ඒ සමගම ආරම්භ කරන ලදී.

ඒ සඳහා දැවැන්ත මහජන මුදල් කන්දරාවක් වැය කරනු ලැබුවේ වඩාත් ඉහළ ප්‍රතිලාභ මෙරට විදුලි පරිභෝගිකයන් වෙත ලබාදීමේ අරමුණින් බව උස් හඬින් මාධ්‍ය සාකච්ඡා ද පවත්වමිනි.

මේ වන විට විදුලිබල මණ්ඩලය කොටස් කර 02 පිටුවට

'කළු නිදහස් දින' විරෝධතා යාපනයේදී සිසුන් 4ක් අත්අඩංගුවට

උතුර හා නැගෙනහිර ජනතාවගේ ගැටලුවලට ස්ථිර විසඳුමක් නොලැබීම, මාධ්‍ය නිදහසට බාධා කිරීමට, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට බාධා ඇතිවන පනත් සම්මත කර ගැනීමට සහ ජනතාවගේ දරාගත නොහැකි ගැටලුවලට විසඳුමක් ලබා නොදීමට එරෙහිව පෙබරවාරි 04 දින කිලිනොච්චියේ සංවිධානයකර තිබූ විරෝධතාවය පොලිස් බලහත්කාරයෙන් විසුරුවා හරින ලදී.

යාපනය විශ්ව විද්‍යාලයේ සිසුන්, අතුරුදන්වූවන්ගේ ඥාතීන් සහ සිවිල් සංවිධාන විසින් විරෝධතාවය සංවිධානය කර තිබිණි. මෙහිදී විශ්ව විද්‍යාල සිසුන් හතර 02 පිටුවට

මාක්ස්ගේ 'ප්‍රාග්ධනය' කෘතිය හුදු ලියැවිල්ලකින් ඔබ්බට ගිය වැඩපිළිවෙළක්!

කුමාර් ගුණරත්නම් සහෝදරයා

මහාචාර්ය සුමනසිරි ලියනගේ සහෝදරයා රචනා කළ 'ප්‍රාග්ධනය -කෙටි හැඳින්වීමක්' කෘතිය ජනගත කිරීම ජනවාරි 30 දින කොළඹ ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදී සිදු වුණා. එම අවස්ථාවේදී පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රධාන ලේකම් කුමාර් ගුණරත්නම් සහෝදරයා කළ අදහස් දැක්වීමෙන් උපුටා ගත් කොටසක් 'වම' පාඨකයන් 02 පිටුවට